# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1986/62 - 2016 සැප්තැම්බර් මස 30 වැනි සිකුරාදා - 2016.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන තීරණ ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2016 ඔක්තෝබර් මස 01 දින සිට වලංගු විය යුතු ය.

එස්. එම්. ගෝඨාභය ජයරත්න,<br>
ලේකම්,<br>
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2016 සැප්තැම්බර් මස 26 වැනි දින,<br>
කොළඹ 05,<br>
කම්කරු මහ ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

රබර් වැවීමේ හා තැනීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1949 නොවැම්බර් මස 25 දිනැති අංක 10047 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, 2015 මැයි මස 05 වැනි දින අංක 1913/5 දරන *ගැසට් පත්‍රයෙන්* රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය ලෙස නැවත ස්ථාපිත කරන ලද ඉහත කී පඩි පාලක සභාවේ, ඉහත කී උපලේඛනයේ සඳහන් තීරණවලට අදාළව 2014 ජූලි 07 දිනැති අංක 1870/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* අවසන් වරට වෙනස් කරන ලද්දාවූ ද තීරණවල III කොටස් (ඒ) හා (බී) කොටස් වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් විය යුතු ය.

*III කොටස - අතිකාල ප්‍රමාණය*

වැඩ කරන සාමාන්‍ය දවසකට වැඩිපුර වැඩ කළ හැම පැයක්ම සම්බන්ධයෙන්ම ගෙවිය යුතු අවම අතිකාල ප්‍රමාණය වන්නේ (කාලම්මිමේ වැඩ සඳහා වූ දෛනික අවම පඩි ප්‍රමාණය 8 න් බෙදීමෙන් නිශ්චය කරගත්) පැයකට ගෙවන අවම ප්‍රමාණය මෙන් 50% ක ගුණයකින් වැඩි වූ ප්‍රමාණයයි.

10 - 406

1A - PG 3147 — 607 (2016/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*